දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

සවිසා 3.2 - සංස්කෘතිය හා සංවර්ධනය
SGYG 3.2 - Culture and Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය

---

01. සමාජ සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වා එහි බහුවිධ දිශානතීන් මොනවාදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

02. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී සංස්කෘතිකමය තත්වයන් ධනාත්මකව මෙන්ම ඍණාත්මකව ද බලපෑම් කරනු ලබන ආකාරය දකුණු ආසියානු සමාජය ආශ්‍රයෙන් නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

03. සංවර්ධන ක්‍රියාවලියෙහි ඍජු ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නාගරික සමාජයන් තුළ මෙන්ම ග්‍රාමීය සමාජයන්හි ද පරිභෝජනවාදයක් ඉස්මතු වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

04. සංවර්ධන ක්‍රියාවලියෙහි දී කුලක්‍රමය වැනි ආරෝපිත තත්වයන් විසින් සිදු කරනු ලබන බලපෑම විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

05. සංවර්ධනය වෙමින් පවතින සමාජයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ගෝලීය කරණයෙහි අයහපත් තත්වයන් මොනවාදැයි පෙන්වා දෙන්න.

06. ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධයෙන් ඇති වූ සමාජ, ආර්ථික හා දේශපාලනික ප්‍රතිවිපාකයන් කවරේදැයි සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ කාන්තාව කෙරෙහි වෙනස්කොට සැලකීම (Discrimination) කෙරේ බලපාන හේතු සාධක මොනවාදැයි පැහැදිලි කරන්න.

08. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.
1. සතරවන කාර්මික විප්ලවය
2. සමාජ සංවර්ධන මිනුම්
3. සංස්කෘතික වෙනස්වීම පිළිබඳ මර්ඩොක්ගේ ආකෘතිය
4. සංස්කෘතික ගෝලීයකරණය